# චරිතායන අධ්‍යාපනය
# 21 වන සියවසේ නව එළඹුමක අවශ්‍යතාව

දයා රෝහණ අතුකෝරාල

## හැඳින්වීම

ඉතිහාසයේ අන් කවර කාලයකට ද වඩා සමාජ පරිහානියක ගති ලක්ෂණ, වර්තමාන අවධියේ දක්නට ලැබෙන බව නො රහසකි. 21 වන ශතවර්ෂයේ අභියෝගවලට මුහුණ දීමේ දී ශිෂ්‍යයන්ගේ පෞරුෂය සංවර්ධනය සහ විශ්ව පුරවැසියන් ලෙස සමාජ සහ ප්‍රජා වගකීම් ඉටු කරලීමේ හැකියාව ඔවුන් තුළ වර්ධනය කරලීමට, සිතාමතා ම විශේෂ උත්සාහයක් දැරිය යුතු බව අධ්‍යාපනඥයෝ අවධාරණය කරති. මිලේනියම් ව්‍යාපෘතිය (Millenium Project) වාර්තාව මගින් ප්‍රකාශයට පත් කර ඇත්තේ මිනිස් වර්ගයා දැවැන්ත ලෙස විනාශයට පත් කරගෙන ඇත්තේ ආචාරාත්මක ක්ෂේත්‍රය බව යි. ඒ අංශයට අයත් පාරිසරික ගැටලු හා දූෂණය, ත්‍රස්තවාදය, ආදායම් අසමානතාව, මත්ද්‍රව්‍ය හා ලිංගික හිංසනයන්ගේ කැපී පෙනෙන වර්ධනයක් දැකගත හැකි බව යි **(Glenn. J. Gordon T.J. & Florescu, E. 2007)**.

ගත වූ ශතවර්ෂ 20ට ම වඩා පසුගිය දශක දෙක තුන තුළ සමස්ත ලෝකයේ ම විද්‍යාව හා තාක්ෂණ දියුණුව පෙරට පැමිණ ඇත. එහෙත් එම දියුණුව දෙපැත්ත කැපෙන කඩුවක් මෙන් සමාජයට බලපෑම් කරයි. විශ්ව සහයෝගී බවට සහ ප්‍රගතියට එම දියුණුව වඩාත් අවස්ථා මතු කරන අතර ම, න්‍යෂ්ටික බලය භාවිතය, කෘමිනාශක හා වල් පැලෑටි නාශක පරිහරණය, ජාන වෙනස් කිරීම හා භෞතික දියුණුවේ නව මාදිලියකට ලෝකය පෙළගැස්වීම මගින් ආචාරාත්මක අභියෝග රැසක් ලෝකයට ඉදිරිපත් කර ඇත. ඒ පමණක් නො ව නව සන්නිවේදනවල ප්‍රසාරණය, සමාජ මාධ්‍ය පරිහරණය වේගවත් වීම මගින් සමස්ත සමාජය ම, විවිධ අර්බුදවලට ලක් වෙමින් පවතී. අනාගතයේ වගකිවයුතු පුරවැසියන් බවට පත් වන වර්තමාන යොවුන් පරපුරට පුද්ගල හා සදාචාර වගකීම් සහිත ව තීරණ ගැනීමට අවශ්‍ය ශක්තිය ලබාදුනහොත් පමණි, ඉහත කී අභියෝගවලට සාර්ථක ව මුහුණ දීමට අවශ්‍ය දැනුම සහ නිවැරදි තීරණ ගැනීමේ කුසලතාව වර්ධනය කරගත හැකි වනුයේ. මේ අභියෝගාත්මක අනාගත ගැටලුවලට සාර්ථක ව මුහුණ දීම සඳහා පාසල් හා උසස් අධ්‍යාපන ආයතන මගින් පුද්ගල චරිත සංවර්ධනය සඳහා ශක්තිමත් අඩිතාලමක් දැමීමේ අවශ්‍යතාව මෑත කාලයේ වඩාත් අවධාරණය කෙරී ඇත.

එම අභියෝගවලට මුහුණ දීම සඳහා චරිතායන අධ්‍යාපනයක (Character Education) අවශ්‍යතාව ඉස්මතු කර ඇත. චරිතායන අධ්‍යාපනය සම්බන්ධ අන්තර්ජාතික මධ්‍යස්ථානය නිව්යෝර්ක්හි පැවැත් වූ සමුළුවේ දී මේ සම්බන්ධ ව දීර්ඝ ව සාකච්ඡා කර ඉදිරිපත් කළ වාර්තාවෙහි අවධාරණය කරනුයේ, දරුවකු වර්ධනය විය යුත්තේ ශක්තිමත් කුළුනු හතරක් මත බව යි. එම කුළුනු හතර නම් ගෙදර හෙවත් පවුල් පරිසරය, පාසල, ආගමික මධ්‍යස්ථාන (පන්සල, පල්ලිය) හා ප්‍රජාව ය. (රූපවාහිනිය, ජනමාධ්‍යය හා ව්‍යාපාරික ලෝකය අයත් වැඩිහිටි ප්‍රජාව ය) මේ හැම කුලුනක් ම එක සේ ශක්තිමත් විය යුතු බවත්, මින් එකදු කුලුනක් හෝ දුබල වුවහොත් සමාජය නමැති ගොඩනැගිල්ල ඉරිතලා යන බවත් ය.

චරිතායන අධ්‍යාපනයක තිබිය යුතු පුළුල් අරමුණු තුනක් එම වාර්තාව අවධාරණය කරය ඇත. එ නම්

- යාවජීව ඉගෙනීමකට, අත්තිවාරමක් හෙවත් පදනමක් ගොඩනැංවීම
- ගෙදර දී ජන සමාජයේ දී සහ සේවා ස්ථානයේ දී සාර්ථක සබඳතා පැවැත්වීමට සහයෝගය දැක්වීම සහ
- ගෝලීයකරණ ලෝකය තුළ තිරසාර සහභාගිත්වයක් පවත්වාගෙන යාමට අවශ්‍ය පුද්ගල අගයන් සහ ගුණධර්ම ගොඩනැංවීමට කටයුතු කිරීමත් ය **(ICCE 2000)**.

එසේ ම අධ්‍යාපන හා මනෝවිද්‍යා පර්යේෂණවලින් පෙන්නුම් කරනුයේ, ශිෂ්‍යයන්ගේ ශාස්ත්‍රීය ඉගෙනුම හා දැනුමත්, කුසලතාත් අබිබවා ගෙන, ඔවුන්ගේ ජයග්‍රහණ හා සාධනය සඳහා වඩාත් වැදගත් වනුයේ, ශිෂ්‍යයන් තුළ ගොඩනගාගෙන ඇති පෞරුෂ ගුණාංග බව ය. දැනට පාසලේ ඉගෙන ගනු ලබන දැනුම සහ කුසලතා, අනාගත රැකියා සඳහා උදව් වනු හෝ නො වනු විය හැකි ය. එසේ වුවත් කවර වූ හෝ වෘත්තීය ක්ෂේත්‍රයක වුව ද සෑම අවස්ථාවක දී ම පාහේ චරිත ගුණාංගවල වටිනාකම අවිවාදයෙන් ම වැදගත් වනු ඇති බව අවධාරණය කර ඇත. **(Farraigton, Camille A. et al, 2012)**.

**චරිතායන අධ්‍යාපනය යනු කුමක් ද?**

චරිතායන අධ්‍යාපනය ඉංග්‍රීසියෙන් හඳුන්වනු ලබනුයේ Charcter Education යනුවෙනි. Character යන ඉංග්‍රීසි වචනය සැකසී ඇත්තේ Charaktér යන ග්‍රීක වචනයෙනි. මෙම වචනයෙහි අදහස වනුයේ එක දෙයක් තවත් දෙයකින් වෙනස් ව හඳුනා ගැනීම යන අර්ථය යි. එක් පුද්ගලයකු තවත් පුද්ගලකුගෙන් පැහැදිලි ව වෙනස් වන්නේ කෙසේ ද යන්න කවර ගුණයන්ගෙන් ද යන්න හඳුනාගැනීම යි. මහාචාර්ය Kevin Ryan iy Karen Bohlin හොඳ චරිතයක් ඇති පුද්ගලයන් යනු, කවුරුන්දැයි නිර්වචනය කරමින් පැවසූයේ, යහපත් චරිතයක් ඇති පුද්ගලයන් යනු යහපත කුමක්දැයි දැනගැනීම, යහපතට ආදරය කිරීම හා යහපත කිරීම (Who know the good, love the good and do the good) යනුවෙනි **(Ryan kevin, Bohlin,**

**Karen, 1999)**. යහපත දැනගැනීම යනු හොඳ හා නරක යනු කවරේදැයි අවබෝධ කර ගැනීම යි. තේරුම් ගැනීම යි. ඉන් අදහස් කරනුයේ කිසියම් අවස්ථාවක සිදුවීම් ගොනු කොට, සිතාමතා ම, කළ යුතු නිවැරදි දෙය (හරි දෙය) තෝරා එය කිරීම ය. යහපතට ආදරය කිරීම යනු, සදාචාර හැඟීම් හා චිත්තවේග පෘථුල ලෙස ගොඩනංවා ගැනීම යි. එයට යහපතට ආදරය කිරීම මෙන් ම නපුරට එරෙහි වීම ද අයත් වේ. එසේ ම, අන් අය සමඟ සහකම්පනය වීමේ හැකියාව යි. යහපත කිරීම යනු, සියලු ම අවස්ථාවන් සහ අදාළ සාධක පිළිබඳ ව සිතිවිලි ගොඩනංවාගෙන ඒ පිළිබඳ ව සැලකිල්ල යොමු කරමින් ක්‍රියාත්මක වීමට කැමැත්ත ඇති කර ගෙන, ක්‍රියාත්මක වීම යි.

චරිතායන අධ්‍යාපනයෙන් අපේක්ෂා කරනුයේ පුද්ගලයා තුළ තමා කෙරෙහිත්, අනුන් කෙරෙහි වගකීමක් ඇති ව, තමාගේත්, අනුන්ගේත් වටිනාකම්වලට ගරු කරමින්, පුද්ගල ජීවිතය හැඩ ගසා ගැනීම සඳහා අවශ්‍ය මඟ පෙන්වීම සහිත අධ්‍යාපනයක් ලබා දීම යි. මේ අනුව චරිතායන අධ්‍යාපනයක අවශ්‍යතාව හා එහි වටිනාකම පිළිබඳ ව මෑත කාලයේ වැඩි අවධානයක් යොමු වී ඇත.

"සදාචාර අගයන් හා තීරණ ගැනීම පිළිබඳ ව ඉගැන්වීම හා ප්‍රායෝගික අභ්‍යාස මගින් සිසුන් තුළ, යහපත් චරිතයක් ගොඩනැවීමේ උත්සාහය චරිතායන අධ්‍යාපනය වේ" යයි ද හඳුන්වා ඇත **(Beninga, J. 1991)**. තෝමස් ලිකෝනා චරිතායන අධ්‍යාපනයේ යනු කුමක්ද යි විස්තර කර ඇත්තේ, සද්ගුණය වගා කිරීම සඳහා හිතාමතා ගනු ලබන උත්සාහයක් යනුවෙනි **(Licona, T. 1988)**. මෙහි වැදගත් පදය වන්නේ හිතාමතා යන්න යි. ළමයින් තමන්ට කැමති පරිදි කටයුතු කරමින්, වයසින් වැඩෙත් ම හොඳ චරිතවත් පුද්ගලයන් වේ යයි අප අභ්‍යුපගම කළ යුතු නැත. වැඩිහිටියන් විසින් උදාහරණ, නිදර්ශන, ආකෘති හා දිරිමත් කිරීම් මගින් ළමයින්ට යහපත කියා දීම අවශ්‍ය ය.

## චරිතායන අධ්‍යාපනයක අවශ්‍යතාව

යහපත් චරිතයක් ගොඩනගා ගන්නේ කෙසේද යයි වර්තමානයේ අප විසින් හිතාමතා ම ඉගැන්විය යුත්තේ, වර්තමාන සමාජයේ ජීවත්වන තරුණයන්ට, පෙර පරපුරේ සිටි තරුණයන් නො දැන සිටි හා මුහුණ නො දුන් නව අවස්ථා හා අභියෝගවලට මුහුණ දීමට සිදු ව ඇති නිසා ය. ජනමාධ්‍යය සහ වෙනත් බාහිර මූලාශ්‍රය මගින් සෘණාත්මක බලපෑම් රැසක් ඔවුන් වෙත නිරතුරු මුදා හරිමින් පවතී. මේ නිසා ඉතිහාසයේ අන් කවර කාලයකටත් වඩා පාසල්වල චරිත සංවර්ධනය පෝෂණය කිරීම සඳහා චරිතායන අධ්‍යාපනයක් ලබා දීම සහ ඒ හා අදාළ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියක් සැලසුම් කිරීම අත්‍යවශ්‍ය ව ඇත. වර්තමානයේ තරුණ ජනගහනයේ බහුතරයක් මූලික සදාචාරවත් හර පද්ධතියක් පිළිබඳ ව ස්ථාවර අවබෝධයකින් තොර ව වැඩෙන හෙයින් ඔවුන්ට මෙම දැනුම ලබා දී ඔවුන්ගේ හෘදය සාක්ෂිය පුනර්ජීවනය කිරීම අවශ්‍ය ව පවතී. මෙම අව්‍යතාව ඉටු නො වුවහොත් ඔවුන්ට හරි වැරැද්ද තෝරාගත නො හැකි වනු ඇත. ආත්ම පාලනය අභ්‍යාස කිරීමට

අවශ්‍ය චිත්ත බලය වර්ධනය කරගෙන නිරතුරු ව ම හරි කුමක්දැයි වටහාගෙන කටයුතු කිරීමට ඔවුන්ට නො හැකි වනු ඇත. **(Josephson, Michael, 2002)**.

## චරිතායන අධ්‍යාපනයකින් ලැබෙන ප්‍රයෝජන

චරිතායන අධ්‍යාපනය යන සංකල්පය තුළට ක්ෂේත්‍ර කීපයක් ම අන්තර්ගත වේ. එය ඡත්‍රපදයකි. (Umbrella Word) සාර්ථක ලෙස චරිතායන අධ්‍යාපන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා ධනාත්මක පාසල් සංස්කෘතිය, සදාචාර අධ්‍යාපනය, සාධාරණ සමාජ සංකල්පය, එකිනෙකාට උදව් කරන පාසල් ප්‍රජාව, සමාජ හා භාවමය ඉගෙනීම, ධනාත්මක යෞවන සංවර්ධනය, ප්‍රජා අධ්‍යාපනය සහ සේවා ඉගෙනුම යන සංකල්ප ද සම්බන්ධ කරගත යුතු වේ. මෙම ඉගෙනුම් ඉගැන්වීම් එළඹුම් මගින් ශිෂ්‍යයන්ගේ බුද්ධිමය, සමාජ, චිත්තවේග සහ ආචාරාත්මක සංවර්ධනය සිදු කිරීමටත්, තරුණයන් වගකිවයුතු, එකිනෙකාට උදව් කරගන්නා සහ සමාජයට හා රටට දායකත්වය සපයන වගකිවයුතු පුරවැසියන් බවට පත් කිරීමටත් උත්සාහ ගනු ලැබේ. දැනුම වර්ධනය කිරීමත්, චරිතවත් අගයන් වර්ධනය කරලීමත් මගින් තනි තනි පුද්ගලයාගේ මෙන් ම සමාජයේ ද සාර්ථකත්වය වර්ධනය වනු ඇත.

## චරිතායන අධ්‍යාපනයේ මූලික අභ්‍යුපගම

චරිතායන අධ්‍යාපනය ගොඩනංවා ඇත්තේ පහත සඳහන් මූලික පිළිගැනීම් කීපය පදනම් කරගෙන ය.

- මෑත කාලයේ ත්‍රස්ත ක්‍රියා, වංචාවන්, මත්ද්‍රව්‍ය භාවිතය හා ලිංගික අපයෝජන ආදි විනාශකාරී තරුණ හැසිරීම් සියල්ලට ම මූලික හේතුව වූයේ යහපත් චරිතයක් වර්ධනය නො වී තිබීම ය.
- මිනිසුන් ස්වයංක්‍රීය ව නැතිනම් ඉබේ ම, යහපත් චරිතයක් ගොඩනංවා නො ගනී. පවුල, පාසල, ආගමික ආයතන, තරුණ සංවිධාන, රජය හා මාධ්‍ය මගින් හිතාමතා ම ඒ වෙනුවෙන් ම සැලසුම් කළ හා කේන්ද්‍රගත කළ උත්සාහයක් යෞවනයන්ගේ චරිතය නංවාලීම සඳහා ක්‍රියාත්මක කළ යුතු වේ.
- යහපත් චරිතයක් හෙවත් සදාචාර චරිතයකට සදාචාරය පිළිබඳ දැනුම (Moral Knowing) සදාචාර හැඟීම (Moral Feeling) හා සදාචාර ක්‍රියා (Moral Action) යන ක්ෂේත්‍ර තුන ම අන්තර්ගත වේ. මෙම සාරධර්ම ගණයට, ගරුත්වය දැක්වීම, වගකීම, විශ්වාස කටයුතු බව, සාධාරණ බව, ආත්ම දමනය, එකිනෙකා රැකබලා ගැනීම හා ධෛර්යය යනාදිය අයත් වේ **(CEP, 2010)**.
- මෙම මූලික හර පද්ධතීන් හෙවත් සාරධර්මවල ඇත්තේ ආත්මීය වටිනාකමක් නො ව, වාස්තවික වටිනාකමකි. ඒවා අප දැන සිටියත් නො දැන සිටියත් ඒවාට විශ්ව වටිනාකමක් ඇත. එම සදාචාර ගුණාංග සඳහා පෞද්ගලික මෙන් ම සාමූහික එකඟතාවක් ද අප තුළ වර්ධනය කරගත

යුතු ව ඇත. මෙම හර ධර්ම මනුෂ්‍යත්වය තුළ මුල් බැසගෙන ඇත. ඒවායේ ඇති විශ්වමය වලංගුතාව නිසා, ඒවා ඉහළින් ම ගරු කිරීමට ශිෂ්‍යයන් පුහුණු කළ යුතු ව ඇත. මෙම මූලික හර පද්ධතීන් පදනම් කරගෙන චරිතායන අධ්‍යාපනයක් ලබා දීමට කිසියම් සමාජයක් කටයුතු නො කරන්නේ නම්, කවර සමාජයක වුව ද සදාචාරාත්මක පරිහානියක් ඇති වීම වැළැක්විය නො හැකි ය.

මේ නිසා අප සමාජය ද යළි සදාචාර සමාජයක් බවට පත්කරලීම සඳහා, චරිතායන අධ්‍යාපන වැඩසටහනක් සමස්ත අධ්‍යාපන ක්‍රියාවලිය පුරාවට ම දියත් කළ යුතු ව ඇත. එය ප්‍රාථමික, ද්විතීයික පාසල්වල මෙන් ම තෘතීයක අධ්‍යාපන (කාර්මික විද්‍යාලය, විශ්වවිද්‍යාලය) ආයතනවල ද සැලසුම් සහගත ව ක්‍රියාත්මක කිරීමට වැඩ සැලසුමක් නිර්මාණය කළ යුතු ව ඇත. **(අතුකෝරාල, 2020).**

## ගුණාත්මක චරිතායන අධ්‍යාපනයක් මගින් ලැබෙන වාසි

ගුණාත්මක චරිතායන අධ්‍යාපනයක් මගින් ලැබෙන වාසි සහගත අවස්ථා 11ක් පාසල්වල සාර්ථකත්වය සඳහා යෝග්‍ය රාමුවක් ලෙසින් CEP මගින් ඉදිරිපත් කර ඇත.

චරිතායන අධ්‍යාපනය මගින්

- යුක්තිය, කරුණාව, මෛත්‍රිය, ගරුත්වය සහ ඒ ගුණාංග සහිත ව ජීවත්වීම වැදගත් වන්නේ කුමක් නිසා ද? යයි තේරුම් ගෙන, වැදගත් මානව ගුණාංග සිසුන් තුළ වර්ධනය කරයි.
- විෂය මාලාව තුළ අන්තර්ගත ආචාර ධර්ම හා බැඳුණ සංකල්ප ගවේෂණය කිරීමෙන්, චරිත සංවර්ධනය ඉහළ නංවයි.
- ශිෂ්‍යයන්, ගුරුවරුන් සහ කාර්ය මණ්ඩලය, දෙමාපියන් සහ ප්‍රජාවගේ සහභාගිත්වය ඇති කරමින් ධනාත්මක හා සදාචාරවත් වටාපිටාවක් නිර්මාණය කරයි.
- සාධාරණ ලෙස ගැටුම් විසඳන ආකාරය වටහා දෙමින්, බිය ගැන්වීම්, තර්ජනය කිරීම් හෝ චණ්ඩතාවෙන් තොර සුරක්ෂිත පාසල් නිර්මාණය කරමින් ඉගෙනීමට හිතකර පාසල් වාතාවරණයක් නිර්මාණය කරයි.
- එය සිත් වර්ධනය කරනවා පමණක් නො ව හදවත් ද පෝෂණය කරයි.
- සාර්ථක පාසල් සඳහා මෙම ක්‍රියාවලිය තීරණාත්මක ය. එකිනෙකාට උදව් කරන සුරක්ෂිත පාසල් වාතාවරණයක් ගොඩනැංවීම සඳහා යහගුණවල වටිනාකම අවබෝධ කර ගැනීමට එය ළමයින්ට උදව් වේ.
- ඔවුන් සාර්ථක හා ඵලදායක පුරවැසියන් වන්නේ කෙසේ ද යන මූලධර්ම ශිෂ්‍යයන්ට ඉගැන්වීමක් ද කරනු ලබයි. එකිනෙකාට උදව් කරන අගයන් පිළිබඳ වැටහීමක් නොමැති ව, සමාජය අඩපණ වනු ඇත. සමාජයේ

යහ පැවැත්ම සඳහා ශිෂ්‍යයන්ට විශ්වමය අගයන් ඉගැන්වීම බෙහෙවින් අවශ්‍ය ව ඇත.

- විශිෂ්ටත්වය සඳහා වෙහෙසීමට ශිෂ්‍යයන්ට සහ වැඩිහිටියන්ට උදව් වන සමෝධානික සංස්කෘතියක් එ මගින් ගොඩනංවයි.
- අගයන් ගරු කරන, වගකීම සහ මෛත්‍රිය පවතින වාතාවරණයක සිටින හෙයින්, තමා සිටිනුයේ සුරක්ෂිත වාතාවරණයකය යන වැටහීම ශිෂ්‍යයන්ට ඇති වේ. හුදෙක් ආරක්ෂක නිලධාරියෙකු මගින් හෝ ස්කෑන් පරීක්ෂණ යන්ත්‍රයක් මගින් හෝ ආරක්ෂා වනවාට වඩා, එම හිතකර සමාජ වාතාවරණය වඩාත් සුරක්ෂිත බව ඔවුන්ට දනේ.
- එය මගින් ගරුත්වය, යුක්තිය, පුරවැසි භාවය, සාධාරණත්වය, තමා කෙරෙහි සහ අනුන් කෙරෙහි වගකීම, පාසලේ දී හා පුළුල් ප්‍රජා සමාජය තුළ ද පවත්වාගෙන යාමට අවබෝධය, ඇතිව ක්‍රියාත්මක වීමට අවශ්‍ය පුහුණුව ශිෂ්‍යයන්ට මෙන් ම වැඩිහිටියන්ට ද ලබාදෙයි.

## චරිතායන අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

චරිතායන අධ්‍යාපන වැඩසටහනක් පාසලක කවර පංතියක වුව ද ආරම්භ කළ හැකි ය. ප්‍රාථමික පාසල්වල දී ශක්තිමත් අත්තිවාරමක් දැමීම ඉතා වැදගත් වන අතර, එම පදනම මත ක්‍රමානුකූල ව චරිතවත් අධ්‍යාපන ක්‍රියාවලියකට සිසුන් බද්ධ කරගත යුතු ය. සමස්ත සමාජය ම චරිතවත් බවට පත් කරලීම සඳහා චරිතායන අධ්‍යාපන වැඩසටහන විශ්වවිද්‍යාලයීය අධ්‍යාපනයට හා අනිකුත් තෘතීයික අධ්‍යාපන මධ්‍යස්ථානවලට මෙන් ම පුහුණු වැඩසටහන්වලට ද සම්බන්ධ කිරීමෙන් වැඩි ප්‍රතිඵල ලබාගත හැකි ය. මෙම අධ්‍යාපන ක්‍රියාවලිය වඩාත් ඵලදායක වීමට නම්, සමස්ත පාසල් ප්‍රජාව ම ඊට අනුගත ව ක්‍රියාත්මක වීම අවශ්‍ය ය. එසේ ම පාසලේ උගන්වන සෑම විෂයකට ම මෙන් ම, සමස්ත පාසල් සංස්කෘතියට ම චරිතායන අධ්‍යාපන වැඩසටහන බද්ධ කළ හැකි ය. මෙම චරිතායන අධ්‍යාපන වැඩසටහන විශ්වවිද්‍යාලය ද ඇතුළත් සියලු ම උසස් අධ්‍යාපන ආයතනවලට ද, හඳුන්වා දිය හැකි ය. පාසලේ දී චරිතායන අධ්‍යාපන වැඩසටහන් සමඟ ක්‍රියාත්මක වූ සිසුන්ට එම ගුණාංග තව දුරටත් අත්හදා බැලීමට හා ක්‍රියාත්මක කිරීමට උසස් අධ්‍යාපන ආයතනවල දී ද අවස්ථාව ලැබිය යුතු ය. යෞවන සමාජ හා තරුණ සේවා වැඩසටහන්වල දී ද, චරිතායන අධ්‍යාපන ක්‍රියාවලිය හිතාමතා ම සැලසුම් කර බද්ධ කළ කල්හි, සදාචාර සමාජයකට බද්ධ වන චරිතවත් පුරවැසියන් නිර්මාණය කරගත හැකිවනු ඇත.

මෙම වැඩසටහන් සැලසුම් කිරීමේ දී ස්වදේශ වාත්සල්‍යයෙන් වගකීම දැරීම, පුරවැසිභාවය, කාරුණිකත්වය යන ගුණාංග ද ජීවිතවලට, නිදහසට බලධාරීත්වයට, පුද්ගලික දේපළවලට ගරු කිරීමට හා ඒවා ආරක්ෂා කිරීමට ද, වැඩසටහන් සම්පාදනය කළ යුතු වේ. එසේ ම අවංක බව, ත්‍යාගශීලී බව, පුණ්‍ය කටයුතුවලට සම්බන්ධ

වීම, ආත්ම පාලනය, වෙනත් ආගමික, ජාතිකත්ව, ජනවාර්ගික කණ්ඩායම් සමඟ එක් ව කටයුතු කිරීම අන්මත ගරු කිරීම හා සහයෝගයෙන් කටයුතු කිරීම යන ගුණාංග ශිෂ්‍යයන්ගේ හා යෞවනයන්ගේ පෞරුෂවලට ඒකාබද්ධ කිරීමට අවධානය යොමුකළ යුතු වේ. **(Aynur Pala 2001)**.

**සාර්ථක චරිතායන අධ්‍යාපනයක් සැලසුම් කිරීමේ දී වැදගත් වන මූලධර්ම පහ**

**දෙනු ලබන උපදෙස් සැලසුම් සහගත විය යුතු ය.**

චරිතායන අධ්‍යාපනය ඉබේ සිදුවන්නේ නැත. කල් ඇතුව ම නිශ්චිත ඍජු උපදෙස් සහිත ව සැලසුම් කළ යුතු ය. වරක් සංවිධානය කළ පසු ව, අනෙකුත් අදහස්වලට සහ පාසල් ව්‍යාප්ත ක්‍රියාකාරකම්වලට ජවය ලබාදෙන ස්ප්‍රිං ලැල්ලක් මෙන් එය කටයුතු කරනු ඇත.

**භාවිතය**

තමන් උගත් දෙය අභ්‍යාස කිරීමට හා භාවිත කිරීමට ශිෂ්‍යයන්ට හැකිවිය යුතු ය. උත්සාහවන්ත හෙවත් අනලස් යන්නෙහි නිර්වචනය කුමක්දැයි දැනගත්ත ද එය භාවිත කරන තෙක් එම දැන ගැනීමෙහි ඇති පලක් නැත.

**ගුරු හිතකාමී බව**

සියලු ම උපදෙස් සහ පුළුල් පාසල් අංශ සියල්ල ම ගුරුවරයාට සැහැල්ලු හා හිතකාමී විය යුතු ය. ගුරුවරුන්ට ඒ සඳහා කැමැත්තක් හා ආකර්ෂණයක් ඇති වුවහොත් ඔවුන් මෙම වැඩසටහන් සඵලවත් ලෙස ක්‍රියාත්මක කරනු ඇත.

**සැමගේ සහයෝගය හා උදව් ඇති ව**

මෙම වැඩසටහනේ උපරිම ප්‍රතිඵල ලබාගැනීමට නම් පාසලේ සියල්ලන්ගේ ම සහයෝගය හා උදව් ලැබීම අවශ්‍ය ය. පාලන අධිකාරියට, විදුහල්පතිවරුන්ට අවශ්‍ය උපකරණ ආධාරක හා අනෙකුත් පහසුකම් සලසා දිය හැකි ය. එසේ ම කාලසටහන උචිත ලෙස සංස්කරණය කර දීම මෙම වැඩසටහනේ වටිනාකම පිළිබඳ ව වරින් වර කතා කිරීම මගින් එහි අගය හා පිළිගැනීම වැඩිකළ හැකි ය.

**ශිෂ්‍යයන් මානසිකව සූදානම් කරන්න**

ද්විතීයික ශ්‍රේණිවල සිසුන් මෙන් ම විශ්වවිද්‍යාලය මට්ටමේ සිසුහු ද, චරිත සංවර්ධන සංකල්පය පිළිබඳ අදහස නිතර සැකයට, සැක සංකාවට භාජනය කර තර්ක විතර්ක ඉදිරිපත් කරති. මේ නිසා සිසුන්ගේ සැකය හා අවිශ්වාසය දුරු කරලීමට මෙම වැඩසටහනේ ඇති ඵලදායිත්වය පිළිබඳ උද්‍යෝගය වර්ධනය කරලීමට සිසුන් මගින් පියවර ගත යුතු ය **(CEIH, 2001)**.

**චරිතායන අධ්‍යාපනයේ දී අවධාරණය කළ යුතු ප්‍රධාන ක්ෂේත්‍ර**

21වන ශතවර්ෂය සඳහා චරිතායන අධ්‍යාපන වැඩසටහන් සැලසුම් කිරීමේ

දී විෂය මාලා යළි සැකසුම් කිරීමේ මධ්‍යස්ථානය විසින් පවත්වන ලද සමුළුවල දී මතු වූ ප්‍රධාන ගති ලක්ෂණ හයක් පහත දැක්වේ. එම ප්‍රධාන ගති ලක්ෂණ හා ඇඳුණු තවත් සුළු ගති ලක්ෂණ රැසක් ම එම ප්‍රධාන කාණ්ඩයට ඇතුළත් කර ඇත. මෙම ගතිගුණ හා චරිත ලක්ෂණවල අන්‍යෝන්‍ය සබඳතාවක් ඇති පරිදි ම මේවා නිතර ම වැඩෙමින් පවතින ක්ෂේත්‍රයකි. මේ පර්යේෂකයන් විසින් ප්‍රධාන ක්ෂේත්‍ර හයක් ඉස්මතු කර දක්වා ඇත **(CCR, 2001)**.

- සතිමත්බව - Mindfulness
- කුතුහලය - Curiosity
- ධෛර්යය - Courge
- ඔරොත්තු දීම - Resilience
- ආචාර ධර්ම - Ethics
- නායකත්වය - Leadership යනුවෙනි.

## චරිතායන අධ්‍යාපන වැඩසටහන්වල ක්‍රියාකාරීත්වය

සාර්ථක චරිතායන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට ඒ හා බැඳුණ සැමගේ සහාය ලබාගැනීමට සංවිධායකයන් සමත් විය යුතු ය. එසේ ම සෑම පාසලක් ම, චරිතවත් රටක් ගොඩනැඟීමට පුරෝගාමිත්වය දක්වන අනාගත පුරවැසියන් බිහි කරන මධ්‍යස්ථානයක් බවට පත් කළ යුතු ව ඇත. පාසල්වල හා අනෙකුත් අධ්‍යාපන ආයතනවල චරිතායන අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී සැමගේ දායකත්වය හා සහයෝගය ලබාගත යුතු ය.

## දෙමාපිය සහභාගිත්වය

ළමයින්ගේ ප්‍රමුඛ සහ ප්‍රධානම ගුරුවරයා වන්නේ දෙමාපියන් ය. එසේ වුව ද පාසල ඉටුකළ යුතු කාර්යභාරයක් ද ඇත. මෙම ක්‍රියාවලිය සාර්ථක කර ගැනීමට පාසල හා දෙමාපියන් අතර සබඳතාව ගොඩනංවා ගත යුතු වේ. පාසල් විසින් චරිතායන අධ්‍යාපන වැඩසටහන් සැලසුම් කිරීමේ දී දෙමාපියන්ගේ සහ ප්‍රජාවගේ කාර්යභාරය ද එම වැඩසටහන තුළට ඇතුළත් කළ යුතු ය.

## පාසලේ භූමිකාව

පාසල්වල ක්‍රියාත්මක කරනු ලබන චරිතායන අධ්‍යාපන වැඩසටහනක් සාර්ථක කර ගැනීමට සමස්ත පාසල් ප්‍රජාව ම සම්බන්ධ කරගත යුතු ව ඇත. Thomas Lickona මේ සඳහා මෙවන් සටහනක් ඉදිරිපත් කර ඇත. **(Lickona, T, 1991)**. "පාසලේ දී, පංති කාමරයේ දී, ධනාත්මක සදාචාර සංස්කෘතියක් ගොඩනැඟීම ආරම්භක පියවරයි. පංති කාමරයේ මෙන් ම පාසලේ සෑම විධිමත්, අවිධිමත් ක්‍රියාදාම ද චරිතායන අධ්‍යාපනයට යොමු කිරීම වැදගත් ය. ඉන් අමතර ව පාසල් ප්‍රජාව වෙතට ද සදාචාර සංස්කෘතිය ව්‍යාප්ත කිරීම අවශ්‍ය ය.

## ගුරුවරුන්ගේ භූමිකාව

චරිතායන අධ්‍යාපනය ලබාදීමේ දී භූමිකා ආකෘති ලෙස, නිදර්ශන ලෙස, කටයුතු කිරීම ගුරුවරුන්ගෙන් අපේක්ෂා කෙරේ. ගුරුවරයා විවිධ භූමිකා ආකෘතිවල ක්‍රියාත්මක වීම අවශ්‍ය ය. වරෙක උපදේශකයකු හා මඟ පෙන්වන්නෙකු වීම, දරුවන්ට ආදරය හා ගරුත්වය දැක්වීම, හිතකර සමාජ චර්යාවන්ට දිරි දීම, මෙන් ම හිංසාකාරී ක්‍රියාවන් වළක්වා ලීමට පියවර ගැනීම ද අපේක්ෂිත ය. ගුරුවරයා පංති කාමරය තුළ මෙන් ම පන්ති කාමරයෙන් පිටත දී ද සදාචාර ක්‍රියාකාරකම් කරන්නට උචිත අවස්ථා මවා දීමට කටයුතු කළ යුතු ය. එසේ දරුවන්ට එකිනෙකාට උදව් කිරීමට හැකි ව්‍යාපෘති නිර්මාණය කර සැලසුම් කර ක්‍රියාත්මක කිරීම මගින් ද චරිත වර්ධනය සිදුකළ හැකි ය. ප්‍රජා සංවිධාන, ශ්‍රමදාන සේවා, වැඩිහිටි නිවාස හා ළමා නිවාසවල ක්‍රියාකාරකම් මගින් එකිනෙකාට ආදරය බෙදා හදා ගැනීමට අවස්ථාව මතු කරදීම අවශ්‍ය වේ. පන්ති කාමරය තුළ දී තීරණ ගැනීම, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, ගැටුම් කළමනාකරණය සඳහා අවස්ථා මතු කළ හැකි ය. එසේ ම සදාචාර තර්කනය, තාර්කික ව යහගුණ වර්ධනය, ආත්ම පාලනය හා අන් අයට ගරුත්වය දැක්වීමට අවශ්‍ය අවස්ථා මතුකර දැක්වීම ද කළ හැකි ය. විෂය මාලාව මගින් අගයන් ඉගැන්වීම, ආචාරාත්මක අගයන් ඇගැයීමට ලක් කිරීම මගින් චින්තන රටාව හා ප්‍රායෝගික හැකියා වැඩි දියුණු කළ හැකි ය. චරිතායන අධ්‍යාපනය නංවාලීමේ අපේක්ෂාවෙන් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කිරීමේ දී සහයෝගී ඉගෙනුම් Co-operative Learning ක්‍රම ශිල්ප හඳුන්වා දීම යෝග්‍ය ය. ළමයින් තනි තනි ව වැඩ කරනු වෙනුවට, අන් අය සමඟ එක් ව කටයුතු කිරීම, වගකීම් දැරීමට පුහුණු කිරීම හා තමාගේ ඉගෙනුම් කටයුතුවල වගකීම තමන්ට භාර ගැනීමට යොමු කිරීමටත්, ගුරුවරයා හිතාමතා සැලසුම් කළ යුතු ය. කියවීම, ලිවීම, සාකච්ඡාව, තීරණ ගැනීම සඳහා අභ්‍යාස හා වාද විවාද කිරීමේ අවස්ථා සකසා දිය හැකි ය. පන්ති කාමරයේ දී හා පාසල් භූමියේ දී මතුවන ගැටලුවල දී ධනාත්මක ව හා සාමකාමී ව ගැටලු නිරාකරණය කරන ආකාරය, සමථකරණ ක්‍රියාවලිය යුක්ති සහගත ව හා සාධාරණ ව කරන අන්දම අත්දැකීම් මගින් ම විඳීමට, ශිෂ්‍යයන්ට අවස්ථා මතු කර දීමත් ගුරුවරයාගේ භූමිකාවලට ඇතුළත් කර ඇත.

## සමස්ත පාසල සඳහා උපාය මාර්ග

පන්ති කාමරයේ දී චරිතායන වැඩසටහන් ක්‍රියාත්මක වීම ප්‍රායෝගික ව හා සාර්ථක ව ක්‍රියාත්මක කිරීමට හැකි වන ලෙස, සමස්ත පාසල සඳහා පොදු චරිතායන වර්ධන වැඩසටහනක් සැලසුම් කළ හැකි ය. ඒ සඳහා ක්‍රියාත්මක කළ හැකි වැඩසටහන් කීපයක් මෙසේ ය.

## පාසලේ ප්‍රතිජනනාත්මක සදාචාර සංස්කෘතියක් නිර්මාණය කරලීමට යෝග්‍ය උපායමාර්ග

මූලික සාරධර්ම හර පද්ධතීන් වර්ධනය කරනු ලබන වාතාවරණයක් මැවීම ඉතා ඵලදායී වේ. එකිනෙකා අන්‍යෝන්‍ය උදව් කරගන්නා හා රැකබලා ගන්නා

ආයතනයක් ලෙසට සමස්ත පාසල් ප්‍රජාවෙහි ම (ගුරු-සිසු හා සහායක කණ්ඩායම) චර්යාව හැඩගැස්වීම මගින්, සමස්ත පාසල් ප්‍රජාව අතර බැඳීමක් හා හිතවත්කමක් වර්ධනය වේ. ජ්‍යෙෂ්ඨ කණ්ඩායමක් ආදර්ශයට ගනිමින්, කනිෂ්ඨ කණ්ඩායම හැඩ ගැසෙනු ඇත. එවැනි ධනාත්මක චරිතවත් ආකෘතියකට සැකසුණ ප්‍රධාන පෙළේ පාසල් කීපයක් ම ලංකාවේ ද හඳුනාගත හැකි ය.

## පන්ති කාමරයෙන් බැහැර ව දයාව දැක්වීම හා රැකබලා ගැනීම

පාසලේ දී උදව් අවශ්‍ය අයට උදවු කිරීමට, පරාර්ථ ක්‍රියාවලට ළමයින් යොමු කිරීමට, වැඩසටහන් සැලසුම් කළ හැකි ය. දිළිඳු ළමයින්ට පොත්පත් හා දිවා ආහාර ලබා දීම, හදිසි ආපදාවක දී හෝ ආධාරයක් අවශ්‍ය විටෙක හෝ ඒකාබද්ධ ප්‍රයත්න සංවිධානය කර උදව් කිරීම මගින් ප්‍රායෝගික ව පරාර්ථ ක්‍රියා ආරම්භ කළ හැකි ය.

## පාසලෙන් බැහැර ප්‍රජාවට සේවා කිරීම

ශ්‍රමදාන හා අසරණ සරණ සේවා සංවිධානය කර, බැහැර ප්‍රජාවට සේවා කිරීම මගින් ද, චරිතායන අධ්‍යාපනය ශක්තිමත් කළ හැකි ය. දෙමාපියන්ගේ සහාය ලබාගනිමින් එවන් ප්‍රජා සේවා ක්‍රියාත්මක කළ කල්හි, වැඩිහිටියන්ගේ ආශීර්වාදය සමඟ අත්දැකීම් ද ලබාගත හැකි ය. පාසලේ කටයුතුවල දී, දෙමාපිය සහයෝගය ලබාගත් කල්හි චරිතවත් බව පුළුල් ලෙස සමාජයට ද සම්බන්ධ කළ හැකි ය.

ඉහත කී උපාය මාර්ග පිළිබඳ අවබෝධයකින් යුතු ව සංවේදී ව කටයුතු කිරීමට මානසික එකඟත්වයක් ගුරුමණ්ඩලයේ හා විදුහල්පතිතුමා වෙත තනි තනිවත්, සාමූහිකවත් වර්ධනය කළ හැකි වූ විට, කෙටි කාලයක් තුළ සාර්ථක චරිතායන අධ්‍යාපන වැඩසටහනක් ක්‍රියාත්මක කළ හැකි ය.

## විධිමත් පාසලෙන් ඔබ්බට චරිතායන අධ්‍යාපනය

කාර්මික විද්‍යාලය හා විශ්වවිද්‍යාලය ද ඇතුළත් සියලු ම තෘතීයික අධ්‍යාපන ආයතනවලට චරිතායන අධ්‍යාපන වැඩසටහන ව්‍යාප්ත කළ යුතු ව ඇත. පාසල් මට්ටමෙන් විවිධ අයුරින්, චරිතායන, ආගමික, පරිසර හිතකාමී, ක්‍රියාකාරකම්වල යෙදුණු, ඒ සඳහා කැපවුණු ශිෂ්‍යයන්ට ද ඉහළ අධ්‍යාපන ආයතනවල දී ඒ සඳහා තම දක්ෂතා ප්‍රායෝගික ව ක්‍රියාත්මක කිරීමට උචිත වටපිටාවක් විශ්වවිද්‍යාලවලය, අධ්‍යාපන විද්‍යාපීඨවල, හෙද හා කාර්මික විද්‍යාලය සැලසුම් කළ හැකි ය.

යහගුණ ඉබේ වර්ධනය වන්නේ නැත. එය හිතාමතා ම සැලසුම් කොට ක්‍රියාත්මක කළ යුතු ය. මල් පැළ ඉබේ හටගන්නේ නැත. එහෙත් වල් පැළ ඉබේ වේගයෙන් හට ගනී. ඒ නිසා වල්පැළ ගලවා දමා මල් පැළ සිටුවීම අවශ්‍ය වේ. දිගු කලක් පුරා වල් පැළ ගලවා මල් පැළ සිටවුවහොත් හා ඒ සඳහා අවශ්‍ය සාත්තු සප්පායම් කළහොත් දිනක වල් පැළ නැති මල් පැළ ඇති මල් පිපී බබළන මල් වත්තක් දැකගත හැකි ය. මේ අයුරින් ම චරිතායන අධ්‍යාපනය ද ප්‍රවේශමෙන් රැක බලාගෙන, හැම තැන ම හැම කල්හි ම, පෝෂණය කළහොත් වර්තමාන සමාජ අර්බුදයට ඔරොත්තු දිය හැකි නව පරපුරක් බිහිකරගත හැකි ය.

## නිගමනය

වේගයෙන් වෙනස් වන වර්තමාන සමාජ සංදර්භය තුළ නො වැටී, නො සැලී, නො ගැටී, අපරාජිත ව ජීවත් වීමට නම් යෝග්‍ය ජීවන අත්දැකීම් සහිත උපාය මාර්ගයක් පන්ති කාමරයට මෙන් ම සමස්ත ජනතාවට ම හඳුන්වා දීමේ අවශ්‍යතාව තේරුම් ගෙන 21 වන සියවසේ අධ්‍යාපනයේ නව මංපෙතක් ලෙස, 1990 දශකයේ සිට චරිතායන අධ්‍යාපනය හඳුන්වා දෙන ලදි. මාර්ටින් සෙලිග්මාන් ඇතුළු ධනාත්මක මනෝවිද්‍යාඥයන් හා අධ්‍යාපනඥයන් ප්‍රකාශ කර ඇත්තේ, "ශතවර්ෂයකට ද වඩා ශිෂ්‍යයන්ගේ පාසල් ඉගෙනීම අවධානය යොමු කර තිබුණේ, සාර්ථකතා, ජයග්‍රහණ හා සාධන ළඟාකර ගැනීමට ය. කෞශල්‍යය වර්ධනය කිරීමට ය. විනයානුකූල කිරීමට ය. එහෙත් එම දක්‍ෂතා වර්ධනය කරමින් ම යහ පැවැත්ම සඳහා කුසලතා හා සාධනය සඳහා කුසලතා යන දෙඅංශය ම එක් ව වර්ධනය කළ හැකි නම් ඒ වඩාත් ප්‍රශස්තය යනුවෙනි. **(Seligman, M.E.P. 2009)**.

චරිතායන අධ්‍යාපන වැඩසටහන ඉහත කී තාර්කිකය සමඟ මනාව ගැළපී යන වැඩසටහනකි. දැනට දශක තුනක පමණ කාලයක් පුරා පෝෂණය වෙමින් පැවති චරිතායන අධ්‍යාපන සංකල්පය වර්තමානයේ ශක්තිමත් න්‍යායාත්මක හා ප්‍රායෝගිකත්ව පදනමක ස්ථාවර ව මුල් බැසගෙන ඇත.

බොහෝ රටවල දැනට සාර්ථක ව ක්‍රියාත්මක වන මෙම වැඩසටහන අප රටට යෝග්‍ය පරිදි ගළපාගෙන සමස්ත අධ්‍යාපන පද්ධතියට ම (පාසල්, දහම් පාසල්, උසස් අධ්‍යාපන ආයතන) බද්ධ කළ හැකි නම් අපගේ නව යොවුන් පරපුර 21 වන ශතවර්ෂයේ පැන නැගෙන කවර අභියෝගයකට වුව ද සාර්ථක ව මුහුණ දීමට සමත්වනු ඇත.

චීනයේ පැවති කාන්තා විමුක්තිය සඳහා බීජිං සමුළු අවසන් වාර්තාවෙහි ආරම්භයේ ම ඔවුන් සඳහන් කළේ "අනාගතය යනු හුදෙක් අප ළඟාවිය යුතු තැනක් නො ව අප විසින් සැලසුම් කොට ළඟාවිය යුතු තැනකි." යනුවෙනි. මේ පරිදි ම ශ්‍රී ලංකාවේ අප ද, සැලසුම් කළ අනාගතයකට යා යුතු ව ඇත. වර්තමාන මෙන් ම අනාගත සමාජයේ ද සාර්ථක ව හා සඵලවත් ව ජීවත් වීමට උචිත නව පරපුරක් බිහි කිරීමට චරිතායන අධ්‍යාපන සංකල්පය ක්‍රියාත්මක කිරීම ද වටිනා මෙහෙවරක් විය හැකි ය.

සමාජානුයෝග කුසලතා හා චරිතායන අධ්‍යාපනය සමෝධානික ව ක්‍රියාත්මක කළ කල්හි, එය පාසල් දරුවන්ගේ අධ්‍යාපන සාධනය (නැණ) ඉහළ නැංවීමට ද, යහ පැවැත්ම ගොඩනැංවීමට ද (ගුණ) උදව් වනු ඇත. විද්‍යාත්මක පදනමකින්, ක්‍රමානුකූල ව එසේ ම තදබල ස්ථාවරයක් සහිත ව, ක්‍රියාත්මක කළහොත් එම වැඩසටහන ඉතා සඵලවත් හා ඵලදායී වනු ඇත. චරිතායන අධ්‍යාපනය, පාසල් පද්ධතියට හා පාසල් විෂය මාලාවට බද්ධ කරගෙන ස්ථාවර බද්ධ පැලයක් ලෙස ශක්තිමත් ව වැඩෙන්නට අවශ්‍ය වාතාවරණය සැපයීම වර්තමාන අධ්‍යාපනඥයන්ගේ ප්‍රමුඛ කාර්යභාරය විය යුතු වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


Aynur Pala (2001). **International Journey of Social Science and Humanities Education. Vol. 3. No. 2.** (2011).

Beninga J.(1991) **Moral Character and Civic Education in Elementary Schools.**

**Character Education Informational Handbook & Guide II** (2001) Public Schools of North Carolina, U.S.A.

**Character Education for the 21st Century: What Should Students Learn**. Center for Curriculum Redesign.

**Character Education Partnership** (2010) Washington DC.

**Eleven Principles of Effective Character Education : A Framework for School Success** (2010) Character Education Partnership. USA.

Glenn, J. Gordon, T.J. & Florescu, E. (2007) **State of the Future. The Millenium Project.** International Centre for Character Education (2000).

Farraigton, Camille A. et al (2012) **Teaching Adolescents to become learners. The role of non cognative factors in shaping school performer**. A critical litreature review consortium on Chicago School Research.

Josephson, Michael, (2002), **Making Ethnical Decisions**. Mc Neill.

Lickona, T. (1992) **Educating for Character "How your schools can teach respect and responsibility**. Bantam Book USA.

Opec (2005) **Ohio Partner in Character Education**. Creating Smart and Good Schools Project.

Ryan kevin, & Bohlin, Karen (1999) **Building Character in School: Bringing Moral Instruction to life San Francisco Jossey** - Bass. Shaping school performer. A critical litreature review consortium on Chicago School Research.

Reynolds, D. (1982) **The Search for Effective Schools**. School Organization 2(3) (215-237).

Seligman, M.E.P. (2009) **Positive Education**, Positive Psychology and Classroom Intervention Oxford Review Of Education (35 3).

අතුකෝරාල, දයා රෝහණ. (2016) **21 වන සියවසේ අධ්‍යාපනය, නව ප්‍රවණතා** : ශික්ෂා මන්දිර ප්‍රකාන, කොළඹ:

අතුකෝරාල, දයා රෝහණ. (2017) **සදාචාර සමාජයක් සඳහා චරිතායන අධ්‍යාපනය** : ශික්ෂා මන්දිර ප්‍රකාශන, කොළඹ:

අතුකෝරාල, දයා රෝහණ. (2018) **ධනාත්මක පාසල් සංකල්පය** : ශික්ෂා මන්දිර ප්‍රකාශන, කොළඹ: